# ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය

## ගෝලීය සත්කාරක අධ්‍යාපනයේ දේශීය සන්නාමය හොබවන අපගේ විශිෂ්ට සාමාජිකයකු වන්න.

### 01. සහකාර කථිකාචාර්ය / කථිකාචාර්ය (AR 1 කාණ්ඩය)

සත්කාරක හා සංචාරක අධ්‍යාපනයේ අනාගතය හැඩගැස්වීමෙහිලා ඔබ අතිශයින් උනන්දුවක් දක්වන අයෙක් ද? අනාගත පරපුරේ සංචාරක කර්මාන්තයේ නායකයින් ගොඩනැගීමේ හැකියාවක් ඔබ සතුද? එසේ නම් මේ ඔබේ අවස්ථාවයි. ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනයේ සම්මානනීය අධ්‍යයන පීඨය හා එක්වන ලෙස අපි ඔබට ආරාධනා කරමු.

**ඔබ ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය තෝරාගත යුත්තේ ඇයි?**

- ගෞරවනීය ආයතනයක් වීම: සංචාරක හා හෝටල් කළමනාකරණ අධ්‍යාපනයේ විශිෂ්ටත්වය සඳහා කැපවූ ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම ආයතනයේ කොටස් කරුවෙකු විය හැකි වීම.
- ක්ෂේත්‍රයේ ප්‍රවීණයින් අප සතු වීම: ආගන්තුක සත්කාරක ක්ෂේත්‍රයේ අනාගතය හැඩගස්වා ගැනීමට අපේක්ෂා කරන වෘත්තිකයන්ට ඔබේ දැනුම සහ ප්‍රවීණත්වය ලබා දීමට හැකි වීම.
- නවෝත්පාදනයේ කේන්ද්‍රස්ථානයක් වීම: විශිෂ්ට අධ්‍යාපනඥයින් හා කර්මාන්තයේ විශිෂ්ටයින් සමඟ සහයෝගීතාවයෙන් උසස් හැදෑරීම් පරිසරයක කටයුතු කිරීමේ හැකියාව.

**අප සොයනුයේ:**

- පළපුරුදු අධ්‍යාපනඥයන් : අප සිසුන්ගේ හැකියාවන් පෝෂණය කිරීමට ඔබගේ නිපුණතා සහ කර්මාන්තයේ පළපුරුද්ද ලබා දීමට හැකි
- විෂය පිළිබඳ විශේෂඥයන් : හෝටල් කළමනාකරණය, සංචාරක අලෙවිකරණය, සූපශාස්ත්‍ර කලාවන් හෝ සත්කාරක, මුදල් යන ක්ෂේත්‍රයන්හි විශේෂඥතාවයක් ඇති
- අභිප්‍රේරිත උපදේශකයන් : සිසුන් ඔවුන්ගේ අධ්‍යයන හා වෘත්තීය ක්ෂේත්‍රයේ දක්ෂයකු වීම සඳහා උද්යෝගිමත් කොට , මාර්ගෝපදේශ ලබා දී අභිප්‍රේරණය කළ හැකි
- ගෝලීය ඉදිරි දැක්මක් සහිත වීම : අපගේ සිසුන් ඉගෙනීමේ අත්දැකීම් තුළින් පොහොසත් කිරීම සඳහා විවිධාංගීකරණ හා ජාත්‍යන්තර අත්දැකීම් සහිතව ඉදිරි දැක්මක් ඇති විශේෂඥයින් වන ඔබ සාදරයෙන් පිළිගනිමු.

| අධ්‍යයන අංශය | තනතුරු | පාසල |
|---|---|---|
| වෘත්තීය සූපවේදය (Professional Cookery) | 01 | මහනුවර |
| චාරිකා හා සංචරණය (Travel & Tourism) | 01 | කොළඹ |
| ආහාර හා පාන කළමනාකරණය (Food & Beverage) | 02 | අනුරාධපුර, කොළඹ |

**සුදුසුකම්**

**බාහිර අයදුම්කරුවන් (පහත 1, 2 හෝ 3)**

01. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් සංචාරක හා සත්කාරක කළමනාකරණය/ භාෂාව පිළිබඳ (ඉංග්‍රීසි භාෂාව පිළිබඳ විශේෂඥතාව) විශේෂ උපාධියක්
02. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් සංචාරක හා සත්කාරක කළමනාකරණ/ භාෂාව පිළිබඳ (ඉංග්‍රීසි භාෂාව පිළිබඳ විශේෂඥතාව) සාමාන්‍ය උපාධියක් සමඟ අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව.
03. ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනයේ (SLITHM) වෘත්තීය සූපවේදය/ ආහාර හා පාන කළමනාකරණය/ අමුත්තන් පිළිගැනීමේ අංශය/ හෝටල් ගෘහපාලනය පිළිබඳ විශේෂඥතාව සමඟ පූර්ණ උපාධිධාරියකු වීම.

සහ

තරු තුනේ හෝ ඉහළ වර්ගීකරණය ලද හෝටලයක විධායක ශ්‍රේණියේ අවම වශයෙන් වසර 02ක පශ්චාත් සුදුසුකම් පළපුරුද්ද.

**අභ්‍යන්තර අයදුම්කරුවන්**

- ඉහත බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් ලබා තිබීම.

**වයස :**

අවුරුදු 22 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 45ට නොවැඩි විය යුතුය. උපරිම වයස් සීමාව අභ්‍යන්තර අයදුම්කරුවන්ට අදාළ නොවේ.

**වැටුප් පරිමාණය :**

AR 1 - 2016 රු: (53,150 - 10 X 1,375 - 15 X 1,910 - 95,550)

**ආරම්භක පියවර :**

රු.53,150/-+ ජීවන වියදම් දීමනාව + අදාළ මාසික දීමනා, ප්‍රසාද දීමනා සහ කාර්යසාධනය මත පදනම් ව දිරි දීමනා.

**වෙනත් තොරතුරු :**

01. සේවක අර්ථසාධක අරමුදලට හා සේවක භාරකාර අරමුදල (EPF හා ETF ) සඳහා දායකත්වය

ඇ.) EPF /සේවක අර්ථසාධක අරමුදලට සේවකයා විසින් ඒකාබද්ධ වැටුපෙන් 10% බැගින්ද සේව්‍යයා විසින් 15% කින් ද දායක වනු ඇත.

ආ.) සේවක භාරකාර අරමුදලට සේව්‍යයා විසින් වැටුපෙන් 3% කින් දායක වනු ඇත.

02. සේවකයා හා ඔහුගේ / ඇයගේ පවුල සඳහා ආකර්ෂණීය වෛද්‍ය රක්ෂණ ආවරණයක් හිමිවේ.
03. ප්‍රවාහන දීමනාවක් ගෙවනු ලැබේ.
04. පැයක් ඇතුළත අදාළ පාසල/ සේවා ස්ථානය වෙත දෛනිකව ළඟා විය හැකි අයදුම්කරුවන්ට ප්‍රමුඛතාවය හිමිවේ.

**සෑම අයදුම්කරුවකුම:**

අ. ශ්‍රී ලාංකික පුරවැසියකු විය යුතුය.

ආ. තනතුරේ රාජකාරි මැනවින් ඉටුකිරීම සඳහා කායිකව හා මානසිකව යෝග්‍ය විය යුතුය.

ඇ. ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට කැමති විය යුතුය.

ඈ. විශිෂ්ට චරිතයකින් හෙබි විය යුතුය.

සම්පූර්ණ ජීව දත්ත විස්තර සහිත අයදුම්පත්, අධ්‍යාපනික සුදුසුකම්, සේවා පළපුරුද්ද ආදියට අදාළ සියලුම සහතිකවල පිටපත් සහ ඥාතීන් නොවන නිර්දේශකයින් දෙදෙනෙකුගේ නම්ද සහිතව ලිපි කවරයේ වම් ඉහළ කෙළවරේ අයදුම්කරන තනතුර හා සේවය කිරීමට කැමති සේවා ස්ථාන සඳහන් කොට 2024.04.26 වන දින හෝ ඊට පෙර පහත සඳහන් අය වෙත ලියාපදිංචි තැපෑලෙන් ලැබීමට සැලැස්විය යුතුය.

**සැලකිය යුතුයි:** යම් අයදුම්කරුවෙකු වෙනුවෙන් ආයතනය වෙත සිදු කෙරෙන සියලු ආකාරයේ බලපෑම් තනතුර සඳහා නුසුදුසුකමක් ලෙස සලකනු ලැබේ.

අසම්පූර්ණ, ඉහත අවශ්‍යතා සපුරාලීමට අපොහොසත්වන අයදුම්පත් හා අවසන් දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරේ.

**අධ්‍යක්ෂ ජනරාල්,**
**ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය**
**නො. 78,ගාලු පාර, කොළඹ 03.**

**සාමාන්‍ය විමසීම් : 011 - 2208300 දිගුව 372/303**
**වැඩි විස්තර සඳහා : www.slithm.edu.lk**